# තේ තතු

ISSN 1391 - 6785

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

ඕසෝන් වියන සංරක්ෂණය සඳහා වන විශේෂ කලාපය

වෙළුම 6 අංක 2


## වටපණු මර්දනය සඳහා වටපණුනාශක

### භාවිතයේදී සැලකිය යුතු කරුණු

පාංශු ධූමකරණයේදී වටපණුනාශනය සඳහා මෙතිල් බ්‍රෝමයිඩ් වෙනුවට විකල්ප ලෙස මෙතම් සෝඩියම් සහ බැසමිඩ් හෙවත් ඩැසොමේට් තේ පර්යේෂණ ආයතනය විසින් නිර්දේශ කරනු ලැබ තිබේ.

එහෙත් මෙම රසායන ද්‍රව්‍යයන් නිසි ලෙස භාවිතා නොකිරීම මිනිස් සෞඛ්‍යයට අහිතකර විය හැකිවා මෙන්ම වෙනත් ප්‍රයෝජනවත් සත්ත්ව කොටස් සඳහා ද අහිතකර බලපෑම් ඇති කිරීමට ඉඩ තිබේ.

මේ නිසා බැසමිඩ් සහ මෙතම් සෝඩියම් භාවිතයේදී පහත ආකාරයෙන් ක්‍රියා කිරීම ඉතා වැදගත් වනු ඇත.

### ගබඩා කිරීම සහ ඉවත් කිරීම

- පියන හෝ ආවරණය හොඳින් වසා අඩංගු භාජනයේම තිබීමට ඉඩ හරින්න
- මිනිස් හෝ සත්ත්ව ආහාර, බීජ වර්ග හෝ පොහොර සමග ගබඩා කිරීම හෝ ප්‍රවාහනය කිරීමෙන් වලකින්න
- හොඳින් වාතාශ්‍රය ඇති, වියලි සිසිල් ස්ථානයක ගබඩා කර තබන්න
- තෙතමනය හෝ සෙල්සියස් අංශක 50 වැඩි උෂ්ණත්වයක් නොමැති ස්ථානවල පමණක් ගබඩා කර තබන්න
- භාවිතා කළ භාජන නැවත භාවිතයට ගත නොහැකි වන සේ විනාශ කර දමන්න
- භාවිතා කළ භාජන ජල ප්‍රභවයන්, ගොවි බිම් හෝ මිනිසුන් ගැවසෙන ස්ථාන වල දැමීමෙන් වලකින්න
- අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා රටේ හෝ ප්‍රදේශයේ පවතින නීති රීති වලට අනුකූලව භාජන ඉවත් කිරීම සිදුකරන්න

### අවවාදයයි !!

- රසායන ද්‍රව්‍ය දරුවන්ගෙන් ඈත් කර තබන්න
- කිසිම විටෙක ආහාර සමග මිශ්‍ර වීමට මෙහි කුඩු හෝ වාෂ්ප ආශ්වාස වීමට, ඇස්, සම හෝ ඇඳුම් මත තැවරීමට ඉඩ නොහරින්න
- භාවිතා කිරීමෙන් පසු හොඳින් අත් පා සෝදා පිරිසිදු වන්න
- භාවිතා කරන විට බුලත් විට කෑම, දුම්බීම ආදී දෙයින් වලකින්න
- සෑම විටම මේවා භාවිතා කිරීමේදී මුළු ශරීරයම වැසෙන පරිදි ආරක්ෂිත ඇඳුම්, ඇස් ආවරණ, අත් ආවරණ, මුව ආවරණ සහ පා ආවරණ ආදිය පලඳින්න
- රසායන ද්‍රව්‍ය භාවිතා කිරීමෙන් පසු සියළුම ඇඳුම් පැළඳුම් සෝදා පිරිසිදු කර ගන්න
- භාවිතයෙන් පසු භාවිතා කළ සියළුම උපකරණ හොඳින් පිරිසිදු කර තබන්න
- කිසිම ජල ප්‍රභවයකට මිශ්‍ර වීමට ඉඩ නොහරින්න

### ප්‍රථමාධාර

- රසායනිකය ඇසෙහි තැවරුණ හොත් වහාම ගලායන ජලයේ අවම වශයෙන් විනාඩි 15 ක් පමණවත් හොඳින් සේදී යාමට සලස්වන්න. වේදනාකාරී තත්ත්වයක් ඇතිවේ නම් වහාම වෛද්‍යවරයෙකු හමුවන්න
- සමෙහි තැවරුණහොත් ජලයෙන් හා සබන් වලින් සෝදා හරින්න. සම මත වේදනාකාරී තත්ත්වයක් ඇතිවුව හොත් වෛද්‍යවරයෙකු හමුවන්න
- රසායනිකය ගිලුණුහොත් පිරිසිදු ජලය වීදුරු දෙකක් බීමට දෙන්න. වමනය කිරීමට උත්තේජනය කරන්න. වහාම වෛද්‍යවරයෙකු කරා ගෙනයන්න
- ආශ්වාස වුවහොත් හැකි ඉක්මනින් පිරිසිදු වාතය ඇති එළිමහන් ස්ථානයකට රැගෙන යන්න. අවශ්‍ය නම් කෘතිම ශ්වසන පහසුකම් සලස්වන්න. හැකි ඉක්මනින් වෛද්‍යවරයෙකු හමුවන්න